# ඩී පී එඩියුකේෂන් කෝඩින් පාසල
# කෝඩින් වෙසක් කලාපය - 2023



## Embed code ඇසුරින්
## App එකක් හෝ ක්‍රීඩයක් වෙබ් පිටුවක එකලස් කිරීම




Preview in a new window — නරඹන්න

⚡ Remix — ආරම්භ කරන්න

DP EDUCATION Coding School

LIVEWORKSHEETS


නිර්මාණය කළ ඇප් එකක් වෙබ් පිටුවකට පෙන්වීම

ඔබ code.org තුළ නිර්මාණය කළ App එකක් එය Share කිරීමේදී ලැබෙන advanced options මගින් එය වෙබ් පිටුවක්ට ඇතුළත් කළ හැකි embed code එක ලබා ගත හැකිය. මේ සඳහා

01. නිර්මාණය කළ ඇප් එකෙහි ඇති 

(Share බොත්තම) ක්ලික් කරන්න.

02. ලැබෙන කොටුවෙහි පහළින් ඇති Show advanced options තෝරන්න.




03. එහි දෙවනුවට ඇති option එක වන embed යන්න තෝරන්න.





LIVEWORKSHEETS

04. දැන් ඔබේ ඇප් එකට අදාල embed code එක <iframe ටැග් එකකින් ආරම්භ වී පෙන්වයි.




05. embed code එක මත ක්ලික් කර එය කොපි කරගන්න.




මේ වන විට ඔබ HTML coding ඉගනගැනීම ආරම්භ කර නොමැති වුවත් මෙම සරල වෙබ් පිටුව සකස් කිරීමට HTML පිළිබඳ විශේෂ දැනුවක් නොතිව ද කළ හැකිය. එවැනි අයට අවශ්‍ය වන්නේ **glitch.com වෙබ් අඩවියේ SingUp වීම පමණි**

LIVEWORKSHEETS


**තවම ඩී පී කෝඩින් පාසලේ 249 ව්‍යාපෘතියේ සිට ඉදිරියට ඇති HTML අධ්‍යයනය ආරම්භ කර නැති අය පහත වීඩියෝව නරඹා glitch.com වෙබ් අඩවියේ SingUp වන ආකාරය දැනගන්න. එසේම 249 ව්‍යාපෘතියේ සිට ඉදිරියට ඇති ව්‍යාපෘති මගින් තවදුරටත් HTML පිළිබඳ කරුණු අධ්‍යයකය කළ හැකිය.**




06. දැන් වෙබ් පිටුව නිර්මාණය කිරීම සඳහා “Glitch” platform එක භාවිතා කරමු. ඔබ විසින් new project එකක් ආරම්භ කර එය තුළ code කිරීම පටන්ගනිමු.

එසේම ඔබ මෙම පාඩමේ මුල පිටුවේ දී ඇති ⚡ Remix ආරම්භ කළේ නම් අදාල කෝඩ්ස් එහි ඇතුළත් කර ඇත.

07. **index.html** ගොනුව තුළ code ඇතුළත් කරමු. (එහි සාම්පල් කෝඩ්ස් දී ඇත්නම් ඒවා delete කර පටන් ගන්න.)




**HTML අධ්‍යයනය ආරම්භ කර නැති අය සඳහා**

html ගොනුව තුළ ඇතුළත් කළ යුතු සම්පූර්ණ code ඊළඟ පිටුවේ දී ඇත.

එහි **<iframe ......... </iframe>** අතර පවතින **embed code** එක වෙනුවට ඔබ ඉහත 05 වන පියවරේදී කොපි කරගත් කෝඩ් කොටස **Paste** කළ යුතුය.

සිංහල අකුරින් දී ඇති වාක්‍ය ඔබට අවශ්‍ය පරිදි වෙනස් කළ හැකිය

LIVEWORKSHEETS

## 08. html ගොනුව තුළ ඇතුළත් කළ යුතු සම්පූර්ණ codes පහත පරිදි වේ.

```
<!DOCTYPE html>
<html>
 <head>
  <title>කෝඩින් වෙසක් කලාපය 2023</title>
  <style>
   body {
    background-color: black;
    color: white;
    text-align: center;
   }
   iframe {
    display: block;
    margin: 0 auto;
   }
  </style>
 </head>
 <body>
  <h2>ආලෝක රටා මවන කෝඩින් වෙසක් කලාපය - 2023</h2>
  <iframe width="392" height="620" style="border: 0px;"
src="https://studio.code.org/projects/applab/U9oPAMyqX7w3a2m5RULqfIfjPJMlyfs9oHEoke8I
aro/embed"></iframe>
 <h3>ඉදිරිපත් කිරීම - ඩීපී කෝඩින් පාසලේ ................ මධ්‍යස්ථානය </h3>
 </body>
</html>
```

LIVEWORKSHEETS

09. දැන් “Glitch” platform එකේ පහළින් ඇති PREVIEW බොත්තම ක්ලික් කර

Preview in a new window තෝරන්න.




දැන් ඔබේ වෙබ් පිටුව පහත පරිදි දර්ශනය වනු ඇත.




ඉහත අකාරයටම ඇප් කිපයක embed code වෙන වෙන වෙනම පිටපත් කරගෙන එහි <iframe ......... </iframe> අතර පවතින කෝඩ් එකම වෙබ් පිටුවට කිපයක් ලෙස ඇතුළත් කළ හැකිය. එමගින් ඔබ නිර්මාණය කළ ඇප් එකතුවක් සහිත වෙබ් පිටුවක් සකස්කරගත හැකිය. උත්සාහ කර බලන්න.

LIVEWORKSHEETS